# 2017 සිංහල අවුරුදු චාරිත්‍ර - ඔස්ට්‍රේලියාව

## අවුරුදු උදාව

2017 අප්‍රේල් මස 14 වන සිකුරාදා ශ්‍රී ලංකා වේලාවෙන් අළුයම 2:04 ට ද සිඩ්නි, කැන්බරා, මෙල්බර්න්,බ්‍රිස්බේන් සහ හෝබාර්ට් නගර වල වේලාවෙන් පෙර වරු 6:34 ට ද, ඇඩිලේඩ් සහ ඩාර්වින් නගර වල වේලාවෙන් පෙර වරු 6:04 ට ද, පර්ත් නගරයේ වේලාවෙන් අළුයම 4:34 ට ද, අලුත් අවුරුද්ද උදා වෙයි.

## පුණ්‍ය කාලය (නොනගතය)

ඒ ඒ නගර වලට පුණ්‍ය කාලය සම්මත ඔරලෝසු කාලයෙන් පහත සඳහන් පරිදි වේ.

සිඩ්නි, කැන්බරා, මෙල්බර්න්, බ්‍රිස්බේන් සහ හෝබාර්ට් නගර වලට අප්‍රේල් මස 14 වන සිකුරාදා අළුයම 12:10 සිට එදින පස් වරු 12:58 දක්වා ද, ඇඩිලේඩ් සහ ඩාර්වින් නගර වලට ට 13 වන බ්‍රහස්පතින්දා පස් වරු 11:40 සිට 14 වන සිකුරාදා පස් වරු 12:28 දක්වා ද, පර්ත් නගරයට 13 වන බ්‍රහස්පතින්දා පස් වරු 10:10 සිට 14 වන සිකුරාදා පෙර වරු 10:58 දක්වා ද පුණ්‍ය කාලය බැවින් එම කාලය ආරම්භ වීමට පෙර සියළු වැඩ අතහැර, පුණ්‍ය කාලයේ පෙර භාගය තුල ආගමික වතාවත් වල යෙදීමත් පුණ්‍ය කාලයේ අපර භාගය තුල පහත දැක්වෙන අයුරින් ආහාර පිසීම, වැඩ අල්ලීම, ගණුදෙනු කිරීම හා ආහාර අනුභවය ආදී චාරිත්‍ර ඉටු කිරීමත් යෝග්‍ය වේ.

## ආහාර පිසීම

අප්‍රේල් මස 14 වන සිකුරදා සුදු සහ නිල් මිශ්‍ර වර්ණ වස්ත්‍රාභරණයෙන් සැරසී උතුරු දිශාව බලා ඒ ඒ නගර වල සම්මත ඔරලෝසු වේලාවෙන් පහත සඳහන් වේලාවන්ට ලිප ගිනි මොළවා ගිතෙල් හා හකුරු මිශ්‍ර කිරිබතක් ද අග්ගලා සහ කැවිලි වර්ගයක්ද පිළියෙල කර ගැනීම මැනවි.

| | | |
|---|---|---|
| සිඩ්නි පෙර වරු 6:57 | බ්‍රිස්බේන් පෙර වරු 6:45 | ඩාර්වින් පෙර වරු 6:59 |
| කැන්බරා පෙර වරු 7:07 | හෝබාර්ට් පෙර වරු 7:22 | පර්ත් පෙර වරු 6:44 |
| මෙල්බර්න් පෙර වරු 7:26 | ඇඩිලේඩ් පෙර වරු 6:46 | |

## වැඩ ඇල්ලීම, ගණුදෙනු කිරීම හා ආහාර අනුභවය

අප්‍රේල් මස 14 වන සිකුරදා සුදු සහ නිල් මිශ්‍ර වර්ණ වස්ත්‍රාභරණයෙන් සැරසී උතුරු දිශාව බලා ඒ ඒනගර වල සම්මත ඔරලෝසු වේලාවෙන් පහත සඳහන් වේලාවන්ට සියලු වැඩ අල්ලා ගණුදෙනු කොට ආහාර අනුභවය මැනවි.

| | | |
|---|---|---|
| සිඩ්නි පෙර වරු 8:04 | බ්‍රිස්බේන් පෙර වරු 7:53 | ඩාර්වින් පෙර වරු 8:09 |
| කැන්බරා පෙර වරු 8:13 | හෝබාර්ට් පෙර වරු 8:27 | පර්ත් පෙර වරු 7:51 |
| මෙල්බර්න් පෙර වරු 8:32 | ඇඩිලේඩ් පෙර වරු 7:52 | |

## හිස තෙල් ගෑම

අප්‍රේල් මස 15 වෙනි සෙනසුරාදා උතුරු දිශාව බලා ඒ ඒ නගර වල සම්මත ඔරලෝසු වේලාවෙන් පහත සඳහන් වේලාවන්ට හිසට නුග පත් ද පයට කරඳ පත් ද තබා නිල් පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී තල තෙල් සහ නුග පත් යුෂ මිශ්‍ර නානු ද ගා ස්නානය කිරීම මැනවි.

| | | |
|---|---|---|
| සිඩ්නි පෙර වරු 11:14 | බ්‍රිස්බේන් පෙර වරු 11:06 | ඩාර්වින් පෙර වරු 11:39 |
| කැන්බරා පෙර වරු 11:24 | හෝබාර්ට් පෙර වරු 11:29 | පර්ත් පෙර වරු 11:24 |
| මෙල්බර්න් පෙර වරු 11:53 | ඇඩිලේඩ් පෙර වරු 11:26 | |

සැකසුම: මහින්ද කරුණාරත්න සිඩ්නි, ඔස්ට්‍රේලියාව Email:mahindawk@gmail.com